සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

පිළිතුරු පත්‍රය
Marking Scheme

ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I,II

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) 2 | (06) පරිභ්‍රමණය | (11) ✓ | (16) නෙප්චූන් |
| (2) 2 | (07) නයිට්‍රජන් | (12) × | (17) ප්ලූටෝ |
| (3) 1 | (08) පකිස්ථානය | (13) ✓ | (18) පාකිස්ථානය |
| (4) 3 | (09) ඕසෝන් | (14) ✓ | (19) බංග්ලාදේශ |
| (5) 4 | (10) මුම්බායි | (15) × | (20) භූතානය |

ලකුණු 2 × 20 = 40

## II පත්‍රය

(01) (i) A - B :- නිම්නය
C - D :- නෙරුව
E - F :- කපොල්ල
G - H :- කොත්කන්ද (ලකුණු 04)

(ii) අදාළ සංස්කෘතික ලක්ෂණ දෙකක නම් ලිවීම සඳහා ලකුණු දෙන්න.
උදා :- පළාත් මායිම් වර්ග, වගාවන් ආදී. (ලකුණු 02)

(iii) අදාළ සම්මත සලකුණු නියමිත සංකේත හා වර්ණවලින් යුක්ත වීම (ලකුණු 10)

(02) (i) සූර්යයා, ග්‍රහලෝක, වාමන ග්‍රහයින්, උපග්‍රහයින්, පාෂාණ කැබලි
(ග්‍රාහක, වල්ගාතරු හෙවත් ධූමකේතු, උල්කා...) මින් දෙකක් ලිවීමට. (ලකුණු 02)

(ii) බුධ, සිකුරු, පෘථිවි, අඟහරු ග්‍රහලෝක හතර නම් කිරීම (ලකුණු 04)

(iii) - දුර අනුව සූර්යයාගේ සිට තුන්වැනිව පිහිටා ඇත.
- දැනට සොයාගෙන ඇති තොරතුරු අනුව ජීවීන් වාසය කරන එකම ග්‍රහලෝකයයි.
- පෘථිවිය මත ජලය, හිතකර වායුගෝලීය සංයුතිය, ගුරුත්වාකර්ෂණ ශක්තිය තිබීම, ජීවය ඇතිවීමටත් පැවැත්මටත් හේතු වී ඇත. ආදී කරුණු සහිත කෙටි විස්තරයක් ලිවීම
(ලකුණු 05)

(03) (i) ගැලිලියෝ ගැලිලි, ක්ලෝඩියස් ටොලමි, නිකොලස් කොපර්නිකස්, ජොහැන්නස් කෙප්ලර්, අයිසෙක් නිව්ටන් දෙදෙනෙක් නම් කිරීම (ලකුණු 02)

(ii) සෝවියට් රුසියාව, ඇමරිකා එක්සත් ජනපදය රටවල් දෙකක්
චන්ද්‍රිකා, දුරදක්නය, අභ්‍යවකාශ රොකට්ටුව වැනි උපකරණ දෙකක් ලිවීම (ලකුණු 04)

(iii) - හිරු හා සඳු දේවත්වයේ ලා සැලකීම
- හිරු සඳු හා ග්‍රහයින් පදනම් කරගෙන ජ්‍යොතිෂ විද්‍යාව නිර්මාණය වී තිබීම
- ග්‍රහ බලයෙන් අපල උපද්‍රව සිදුවේය යන විශ්වාසයෙන් ඇතැම් අය ග්‍රහ ශාන්ති කර්ම පැවැත්වීම
- උපන් වේලාවේ ග්‍රහ පිහිටීම සලකා ජන්ම පත්‍රය සැකසීම
- හිරු සඳු පදනම් කරගත් විවිධ උත්සව හා චාරිත්‍ර
- ආයුර්වේද ප්‍රතිකාර සඳහා ශාක කොටස් ලබාගැනීමේ දී පවතින විශ්වාස.. කරුණු පදනම් කරගෙන වගන්ති පහක් ලිවීම (ලකුණු 05)

(04) (i) ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, රුසියාව රටවල් දෙකක් නම් කිරීම (ලකුණු 02)
(ii) - භ්‍රමණය යනු පෘථිවිය තම අක්ෂය වටා (බටහිර සිට නැගෙනහිරට) කැරකීම යනුවෙන් සඳහන් කර තිබීමට
- දිවා රාත්‍රී ඇතිවීම
- වේලාවේ ප්‍රාදේශීය වෙනස්කම් ඇතිවීම සඳහා (ලකුණු 04)
(iii) ගිම්හාන, සරත්, ශීත. වසන්ත ඍතුවලින් කැමති එක් ඍතුවක් පිළිබඳ විස්තර කර තිබීම (ලකුණු 05)

(05) (i) ද්‍රව, ඝන, වාෂ්ප නැතහොත් ජලය. අයිස්, ජලවාෂ්ප ලෙස සඳහන් කරුණුවලින් දෙකක් ලිවීම (ලකුණු 02)
(ii) ජීවීන්ගේ පැවැත්ම සඳහා, ගෘහස්ථ කටයුතු සඳහා, කෘෂිකාර්මික කටයුතු සඳහා කර්මාන්ත සඳහා
ජල විදුලිබල නිෂ්පාදනය ආදී කරුණුවලින් හතරක් ලිවීම (ලකුණු 04)
(iii) - කර්මාන්තවල අපවිත්‍ර ජලය ජල මාර්ග (ගංගා ඇළ දොළ)වලට එක් කිරීම
- කෘෂි රසායනික ද්‍රව්‍ය ජලයට එක් කිරීම
- ජල මාර්ගවලට කුණු කසල දැමීම ආදී කරුණු දෙකක් සඳහන් කර, ඒවා වළක්වා ගැනීමට අනුගමනය කරන ක්‍රියාමාර්ග සරලව විස්තර කිරීම (ලකුණු 05)

(06) (i) උතුරු මායිම - හිමාලය කඳු වැටිය (ලකුණු 02)
දකුණු මායිම - ඉන්දියන් සාගරය
(ii) ඉන්දියාව, ශ්‍රී ලංකාව, බංග්ලාදේශය, නේපාලය, භූතානය, පකිස්තානය (ලකුණු 04)
(iii) - කෘෂිකර්මාන්තය හා සත්ත්ව පාලනය ප්‍රධාන ජීවන රටාවයි.
- කඳු අතර පහත් බිම්වල හෙල්මළු වගාව සිදු කරයි.
- කඳු ආශ්‍රිත ප්‍රදේශවල ගවයන් හා බැටළුවන් ඇති කරයි.
- කඳු නගින අයට මග පෙන්වීම, භාණ්ඩ අලෙවිය, බර උසුලාගෙන යාම වැනි සංචාරක කර්මාන්තය ආශ්‍රිත රැකියා
- කාන්තාවන් රෙදි විවීම, නූල් ගෙතීම වැනි රැකියාවල නිරත වීම (ලකුණු 05)

(07) (i) වැලිපර, කලපු. බොකු, තුඩු , කොරල්පර, කඩොලාන, දූපත් ආදී භෞතික ලක්ෂණ දෙකක් නම් කිරීම (ලකුණු 02)
(ii) හිරිගල් කැඩීම, කොරල්පර විනාශ කිරීම, අනවසර ඉදිකිරීම්, වැලි ගොඩ දැමීම, වෙරළ ආශ්‍රිත ශාක විනාශකිරීම ආදි කරුණු දෙකක් ලිවීම (ලකුණු 04)
(iii) - කොරල්පර සහිත නොගැඹුරු මුහුද
- දර්ශනීය සුදු වැලිතලා සහිත වෙරළ තීරය
- සංචාරක ආකර්ශනය ඇතිවන අයුරින් සකස් කළ හෝටල් පහසුකම්
- පැහැදිලි ජලය
- හිරු එළිය විඳගත හැකි ස්ථාන බහුලවීම
- රක්ෂිත කලපු / හුදෙකලා දූපත් / ස්වාභාවික වරායන්
මෙම කරුණු ඇතුලත් වගන්ති පහක් ලිවීම (ලකුණු 05)